සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

88 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

| | | |
|---|---|---|
| නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය | I, II | පැය තුනයි |
| வடிவமைப்பும் நிருமாணத் தொழினுட்பவியலும் | I, II | மூன்று மணித்தியாலம் |
| Design and Construction Technology | I, II | Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes


අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය I


**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** පහත සඳහන් සංකේත අතුරෙන් තෙවන කෝණ සෘජු ප්‍රක්ෂේපණ ක්‍රමයට අදාළ සංකේතය කුමක් ද?



(1)



(2)



(3)



(4)

**2.** පහත විකසන රූප අතුරෙන් චතුස්තලයක විකසනය දැක්වෙන්නේ කවර රූපයක ද?


(1)


(2)



(3)


(4)


**3.** සම්මත ක්‍රම අනුගමනය කර සෘජු ප්‍රක්ෂේපණ චිත්‍ර ඇඳීමේදී නිතර ම අදාළ වස්තුවේ ඉදිරි පෙනුම,
(1) සැලැස්මට උඩින් හෝ යටින් ඇඳිය යුතු ය.
(2) සැලැස්මට පැත්තෙන් පමණක් ඇඳිය යුතු ය.
(3) සැලැස්මට උඩින් පමණක් ඇඳිය යුතු ය.
(4) සැලැස්මට යටින් පමණක් ඇඳිය යුතු ය.

[දෙවැනි පිටුව බලන්න.

4. යම්කිසි වස්තුවකට අදාළ වන සේ ඇඳි ඉදිරි පෙනුම චිත්‍රයක් පහත රූපයේ දැක්වේ.



ඉහත රූපයේ සැලැස්ම සම්මත රේඛා සමග ඇඳි විට එය නිරූපණය වන්නේ පහත කවර රූපයකින් ද?




(1) (2) (3) (4)

5. වෘත්ත පරිධියක බාහිර ලක්ෂ්‍යයක සිට එම වෘත්තයට ඇඳිය හැකි ස්පර්ශක ගණන,
(1) එකකි. (2) දෙකකි. (3) තුනකි. (4) තුන්සිය හැටකි.

6. කිසියම් අරයකින් අඳින ලද වෘත්තයක පරිධිය එම අරයෙන් ම කවකටුවකින් ඡේදනය කරන්නේ නම්, එම වෘත්ත පරිධිය ස්ථාන කීයකින් ඡේදනය වේ ද?
(1) දෙකයි (2) හතරයි (3) හයයි (4) අටයි

7. රූපයේ දැක්වෙනුයේ ත්‍රිමාන රූපී කේතුවක ඉදිරි පෙනුමකි.




ඉහත රූපයේ දක්වා ඇති කැපුම් තල අතුරෙන් වෘත්තයක් පෙන්නුම් කරන කැපුම් තලය කුමක් ද?
(1) $A-A$ තලය (2) $B-B$ තලය
(3) $C-C$ තලය (4) $D-D$ තලය

8. කාර්මික ඇඳීමේදී උපයෝගී කරගනු ලබන පරිමාණය හෙවත් නිරූපණ සාධකය දැක්වෙන්නේ පහත කුමන පිළිතුරේ ද?
(1) වස්තුවේ සත්‍ය දිග ÷ රූපයේ පෙන්වන දිග (2) රූපයේ පෙන්වන දිග ÷ වස්තුවේ සත්‍ය දිග
(3) වස්තුවේ සත්‍ය දිග × රූපයේ පෙන්වන දිග (4) රූපයේ පෙන්වන දිග × වස්තුවේ සත්‍ය දිග

9. නිතර වර්ෂාවට නිරාවරණය වන එළිමහන් ව්‍යුහයක් ඉදිකිරීම සඳහා ලෝහමය ද්‍රව්‍යයක් තෝරා ගැනීමේදී ඉහළ ම ප්‍රමුඛතාව ලබාදිය යුතු ගුණාංගය කුමක් ද?
(1) විද්‍යුත් සන්නායකතාව (2) තාප සන්නායකතාව
(3) සුවිකාර්යතාව (4) විඛාදන ප්‍රතිරෝධය

10. දැව කඳක පොත්ත ඉවත් කිරීම නිසා, එළය කොටසෙහි ජලය වේගයෙන් වාෂ්ප වී යාමෙන්, දැව කඳෙහි පිටත සිට ඇතුළට ඇතිවන පැලීම හඳුන්වන්නේ කුමන දැව දෝෂය ලෙස ද?
(1) තරු පලුද්ද (2) අරටු පලුද්ද (3) වට පලුද්ද (4) අඩවට පලුද්ද

11. ස්ථිර ඉදිකිරීමකදී, වහලයක පරාල හා බාල්ක සඳහා පහත සඳහන් කුමන දැව වර්ගය වඩාත් සුදුසු වේ ද?
(1) ලුණු මිදෙල්ල (2) ගිනිසපු (3) ඇල්බීසියා (4) ඇට්ටෝනියා

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**12.** ඉදිකිරීම් භූමියක 45 m ක දිගකින් යුත් තිරස් මිනුමක් (Horizontal measurement) ගැනීමට අවශ්‍ය වූ විට, ලිනන් මිනුම් පටිය භාවිත කරන්නේ නම්, මුහුණ දිය හැකි ප්‍රධානත ම තාක්ෂණික අභියෝගය කුමක් ද?
(1) මිනුම් පටිය සාමාන්‍ය රෙදි පටියක් සේ ඇදෙන සුළු බැවින්, වැරෙන් ඇදීමේදී නිවැරදි දිග ලබාගැනීමේ අපහසුව
(2) මිනුම් පටිය තුළ ඇති සිහින් වානේ කම්බි නිසා අධික උෂ්ණත්වයේදී දිග වෙනස් වීමේ අවදානම
(3) දිගු දුර මැනීමේදී මිනුම් පටිය මධ්‍යයෙන් එල්ලා වැටීම මගහැරෙන පරිදි මිනුම් ලබා ගැනීමේදී ඇති වන දුෂ්කරතාව
(4) අඩි, අඟල් සහ අඟලේ කොටස් මිස, සෙන්ටිමීටර වැනි මෙට්‍රික් මිනුම්, ලිනන් මිනුම් පටිවල සටහන් නොවීම

**13.** දිග 15 cm ක වානේ කෝදුවකට වඩා 60 cm ක් දිග නමන කෝදුවක් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතුවලදී බහුලව භාවිත කිරීමට ප්‍රධානත ම හේතුව කුමක් ද?
(1) වානේ කෝදුවට වඩා නමන කෝදුව ඉතා නිවැරදි මිනුම් ලබාදීම
(2) වානේ කෝදුවේ එක් කෙළවරක් කවාකාරව නිමවා තිබීම
(3) නමන කෝදුව දිගු මිනුම් සඳහා හැසිරවීමට පහසු වීම
(4) නමන කෝදු ගොඩනැගිලි ඉදිකිරීම්වලදී පමණක් භාවිත කිරීම

**14.** කුස්තානමක් භාවිත කරමින් ගඩොල් වරිවල උස පරීක්ෂා කිරීමේ සහ සමාන උසට පිහිටුවා ගැනීමේ ක්‍රියාවලිය, ඉදිකිරීමක ගුණාත්මක භාවයට දායක වීම පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.
A – ගඩොල් බැම්මේ ද්‍රව්‍ය අනුපාතය නිවැරදිව පවත්වා ගැනීම.
B – ගඩොල් බැම්මේ සිරස් කුස්තුර ලම්බකව පවත්වා ගැනීම.
C – ලින්ටල් හා බාල්ක නිවැරදි උසකින් පිහිටුවා ගැනීම.
D – ගඩොල් බැම්ම මත යෙදෙන භාරයක් සමතුලිතව බෙදා හැරීම.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) A හා D පමණි. (3) B හා C පමණි. (4) C හා D පමණි.

**15.** වැඩහලක නිතර භාවිත කරන ආවුද සහ උපකරණ සෙවණැලි පුවරුවක (shadow board) ගබඩා කිරීමේ මූලික අපේක්ෂා පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.
A – ආවුද නිෂ්පාදකයා විසින් නිකුත් කරන ලද උපදෙස් නිවැරදිව පිළිපැදීමට.
B – අවශ්‍ය ආවුද, උපකරණ පහසුවෙන් හඳුනාගැනීමට.
C – උපකරණ අස්ථානගත වී ඇත්දැයි ඉක්මනින් පරීක්ෂා කර බැලීමට.
D – ආවුද සඳහා අවශ්‍ය විදුලිය නිවැරදිව භාවිත කිරීමෙන් පුද්ගල ආරක්ෂාව තහවුරු කිරීමට.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) A හා D පමණි. (3) B හා C පමණි. (4) C හා D පමණි.

**16.** සැලසුමකට අනුව භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේදී එම භාණ්ඩයේ නිරවද්‍යතාව සහ ප්‍රමාණය තහවුරු කිරීමට වඩාත් බලපාන සාධකය කුමක් ද?
(1) හැඩය (2) පරිමාණය (3) මිනුම් (4) කොටස් ප්‍රමාණය

**17.** බිරින් වැඩි දැව කොටස් සම්බන්ධ කිරීමට මුරිච්චි හා බදාණ යොදා ගැනීමේදී ලෝහ වොෂර භාවිත කරන්නේ කුමක් සඳහා ද?
(1) සෞන්දර්යාත්මක පෙනුමක් ලබා ගැනීමට
(2) ලීයට සිදු වන හානිය අවම කර බන්ධනය ශක්තිමත් කිරීමට
(3) මුරිච්චි හා බදාණවල ආරක්ෂාවට
(4) මුරිච්චි හා බදාණ පහසුවෙන් ගලවා ඉවත් කිරීමට

**18.** දැව කර්මාන්තයේදී, වීදුරු බැඳීමට යොදන ඇණ වර්ගය කුමක් ද?
(1) ටින්ටැක්ස් ඇණ (2) පනේල ඇණ
(3) ගිම්පි ඇණ (4) කොකු ඇණ

**19.** ලීයේ එකම මාංශය දිගේ ඇණ තැබීමෙන්,
(1) ඇණය ඇද වෙයි.
(2) ලීය පැළී යයි.
(3) ඇණය හොඳින් ලීය තුළට ගමන් කරයි.
(4) මූට්ටුව දුර්වල වෙයි.

**20.** දැවයක ඉස්කුරුප්පු ඇණ ඇල්ලීමේදී ඇණ හිසේ කට්ටයට නොගැළපෙන ඉස්කුරුප්පු නියනයක් භාවිත කිරීමෙන් ඇති විය හැකි අහිතකර ප්‍රතිඵලය කුමක් ද?
(1) ඇණයේ පොට කැඩී යාම (2) ඇණ හිසට හානි සිදු වීම
(3) දැවය පුපුරා යාම (4) ඇණය ගිල්වීමට අපහසු වීම

**21.** ජල සැපයුම් පද්ධතියක භාවිත වන කපාටවල ප්‍රධාන කාර්යයක් **නොවන්නේ** කුමක් ද?
(1) ජලය ගලා යාම පාලනය කිරීම
(2) ජලය ආපසු ගලා ඒම වැළැක්වීම
(3) ජලය ගලා යාම ස්වයංක්‍රීයව නැවැත්වීම
(4) ජල සැපයුම් පද්ධතියේ පීඩනය වැඩි කිරීම

**22.** කොන්ක්‍රීට් මිශ්‍රණයක ජල : සිමෙන්ති අනුපාතය අඩු කිරීමෙන් ප්‍රධාන වශයෙන් ඇති විය හැකි ප්‍රතිඵලය කුමක් ද?
(1) කොන්ක්‍රීට්වල වැඩ කිරීමේ පහසුව අඩු වීම
(2) මිශ්‍රණයේ ආරම්භක සවි වීමේ කාලය දික් වීම
(3) කොන්ක්‍රීට්වල ශක්තිය සැලකිය යුතු ලෙස වැඩි වීම
(4) මිශ්‍රණයේ මුළු පිරිවැය ඉහළ යාම

**23.** කොන්ක්‍රීට් සුසංහසනය (compaction) කිරීමේ මූලික අරමුණ කුමක් ද?
(1) කොන්ක්‍රීටයේ සම්පීඩන බලය වැඩි කිරීම
(2) කොන්ක්‍රීට් මිශ්‍රණයේ හිඩැස් අතරට ජලය ගමන් කරවීම
(3) කොන්ක්‍රීට් මිශ්‍රණයේ හිරවී ඇති වාතය ඉවත් කිරීම
(4) වැරගැන්වුම් ද්‍රව්‍ය හා කොන්ක්‍රීට් අතර බන්ධනය අඩු කිරීම

**24.** කිසියම් හැටුමක් මත චලනය විය හැකි භාර හැඳින්වෙන්නේ,
(1) අජීවී භාර ලෙස ය. (2) පාරිසරික භාර ලෙස ය.
(3) සජීවී භාර ලෙස ය. (4) වෙනත් භාර ලෙස ය.

**25.** මානව ජීවය ආරම්භක අවධියේදී මිනිසා ආහාර සඳහා දඩයම් කරගත් මාංශ කොටස් වෙන් කර ගැනීම සඳහා ආවුද වශයෙන් භාවිත කරන ලද්දේ කුමක් ද?
(1) පොරව (2) කෙටේරිය
(3) තෝමරය (4) ගල් පතුරු

**26.** ඉදිකිරීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී මූලිකව ම සලකා බැලිය යුතු වන්නේ,
(1) ද්‍රව්‍යවල මූලික ගුණයි. (2) ද්‍රව්‍යවල මිල අඩු බවයි.
(3) ද්‍රව්‍ය භාවිත කිරීමේ පහසුවයි. (4) ද්‍රව්‍යවල සෞන්දර්යාත්මක පෙනුමයි.

**27.** ඒක බීජ පත්‍ර ශාකයක් බාහිරින් හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ,
(1) පත්‍ර නාරටි දැලක ආකාරයෙන් යුක්ත වීමයි.
(2) පළල් පත්‍ර හෝ ඉති සහිත සිහින් පත්‍ර හෝ පිහිටීමයි.
(3) පත්‍ර පටුව හා දික්ව පිහිටීමයි.
(4) බීජයේ පත්‍ර දෙකකට වඩා පිහිටීමයි.

**28.** රූපයේ දැක්වෙන්නේ දැව කොටසක කෙඳි පිහිටා ඇති ආකාරයයි.



මෙම පිහිටීම හඳුන්වන නම කුමක් ද?
(1) හරඬුව (Spike) (2) මළ ගැටය (Dead knot)
(3) බඳ ගැටය (Live knot) (4) දිරුම (Rot)

**29.** රට අඹ කඳකින් ඉරාගත් ලෑලි තොගයක් ටික දිනක් මඩේ ගිල්වා තබන ලදී. එසේ කිරීමට හේතුව කුමක් ද?
(1) ලෑලිවල වර්ණය වෙනස් කිරීම සඳහා
(2) ලෑලි ඇද ගැසීම වැළැක්වීම සඳහා
(3) ලෑලිවලට කෘමීන්ගෙන් උවදුරු සිදු වීම වැළැක්වීම සඳහා
(4) ලෑලි සොර සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



**30.** පැතලි කපන කටුව මුවහත් තැබීම සඳහා ගිනි ගලේ අල්ලන කෝණය වන්නේ මින් කුමක් ද?
(1) 55° (2) 60° (3) 65° (4) 70°

**31.** කියතක් මුවහත් තබන විට කියතෙහි දත් උඩු අතට සිටින සේ දඬු අඬුවක සිරකර අල්ලා, තරමක් ගෙවුණු පැතලි පීරක් කියත් දත් මත කීපවරක් මුල සිට අගට අතුල්ලනු ලැබේ. මෙම ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ කෙසේ ද?
(1) කියත් දත් උස් මිටි ගෑම (2) කියත් දත් තෙත්තියම් තැබීම
(3) කියත් දත් හැඩ ගෑම (4) කියත් දත් මුවහත් තැබීම

**32.** නැවත මුවහත් කිරීම කළ **නොහැකි** ආවුදය/උපකරණය මින් කුමක් ද?
(1) ඉස්කුරුප්පු නියන (2) කපන කටුව
(3) ඇඹරුම් විදුම් කටුව (4) රාස්පය


**33.** කොහුකෙඳි බුරුසුවක, දැවමය මිටට කොහුකෙඳි සවි කිරීම සඳහා සුදුසු ඇණ වර්ගය මින් කුමක් ද?
(1) ගිම්පි ඇණ (2) කොකු ඇණ
(3) ටින්ටැක්ස් ඇණ (4) පනෙල් ඇණ

**34.** වඩු කාර්මිකයකු තමා විසින්ම නිෂ්පාදනය කරන ලද දැව භාණ්ඩයකට මිලක් නියම කරන ලදී. ගැනුම්කරුවකු භාණ්ඩය මිලට ගැනීමේදී වට්ටමක් ඉල්ලයි. මෙම අවස්ථාවේදී වට්ටම් ලබා දීමට හැකි වන්නේ නිෂ්පාදන ඇස්තමේන්තුවේ කුමන ශීර්ෂයකට අදාළ මුදලින් ද?
(1) අමුද්‍රව්‍ය වියදම් ශීර්ෂයෙන් (2) ප්‍රවාහන වියදම් ශීර්ෂයෙන්
(3) ලාභය සඳහා එකතු කළ ශීර්ෂයෙන් (4) උඩිස් වියදම් ශීර්ෂයෙන්

**35.** ලාක්ෂා ගල්වා නිමහම් කිරීමට සුදුසු දැව භාණ්ඩයක් වන්නේ මින් කුමක් ද?
(1) ඡායාරූප රාමුවක් (2) බිත්ති රාක්කයක්
(3) සෙල්ලම් අශ්වයෙක් (4) සේසත් මිටක්

**36.** කොණ්ඩා කපන ස්ථානයක ළමා කොණ්ඩ කැපීමේදී දරුවා වාඩි කරවීම සඳහා උස පුටුවක් භාවිත කරයි. එම ආසනය වැඩි උසක් සහිතව නිර්මාණය කිරීමේදී හැටුම්වල පැවතිය යුතු කුමන මූලික ගුණාංගයක් උපයෝගි කරගනී ද?
(1) ශක්තිය (2) මානව ගතික විද්‍යානුකූලබව
(3) ස්ථායි බව (4) ආරක්ෂා සහිත බව

**37.** ඝනකම 25 mm වූ ලෑල්ලක මිනුම් පහත දැක්වේ. මෙවැනි ලෑලි කැබලි 5ක් ඇතුළත් දැව තොගයක මුළු වර්ගඵලය $m^2$ වලින් කොපමණ ද?





(1) $0.012\ m^2$ (2) $0.5\ m^2$ (3) $1\ m^2$ (4) $12\ m^2$

**38.** කාර්මික ක්ෂේත්‍රයේ සමහර අවස්ථාවල භාවිත වන 'අනුයෝගි උපකරණ' යනු මොනවා ද?
(1) විදුලි බලයෙන් ක්‍රියාකරන සැහැල්ලු උපකරණ විශේෂයකි
(2) අදාළ උපකරණය නොමැති විටකදී අවස්ථාවට අනුව සකස් කරගෙන භාවිත කරන උපකරණ විශේෂයකි
(3) අතීතයේදී භාවිත කළ නමුත් ක්‍රමයෙන් අභාවයට යන උපකරණ විශේෂයකි
(4) අතීතයේදී භාවිත කළ අතින් ක්‍රියාකරන උපකරණයකි

● ප්‍රශ්න අංක **39** සහ **40** ට පිළිතුරු සැපයීමේදී පහත දැක්වෙන රූපසටහන උපයෝගී කර ගන්න.

පහත රූපයේ දැක්වෙන්නේ මුළුතැන්ගෙයක භාවිත වන කුඩා බංකුවකි. බංකුවේ මතුපිට තට්ටුව, ලෑලි දෙකකින් සවිකර ඇත.




**39.** පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න.

A – පසක් ගිරි මූට්ටුව, කුඩුම්බි මූට්ටුව යන මූට්ටු වර්ග භාවිත කළ හැකි ය.
B – අඩගිරි මූට්ටුව, හේත්තු මූට්ටුව යන මූට්ටු වර්ග භාවිත කළ හැකි ය.
C – අඩපලු මූට්ටුව, කතිරපලු මූට්ටුව යන මූට්ටු වර්ග භාවිත කළ හැකි ය.

P ස්ථානයේ දැව මූට්ටුව පිළිබඳ ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි.
(3) B හා C පමණි. (4) A, B හා C සියල්ලම ය.

**40.** පහත ප්‍රකාශ සලකන්න.

A – හේත්තු මූට්ටුව හෝ දිවත සහිත පුලුක්කු මූට්ටුව භාවිත කළ හැකි ය.
B – හේත්තු මූට්ටුව හෝ පසක් ගිරි මූට්ටුව භාවිත කළ හැකි ය.
C – දිවත සහිත පුලුක්කු මූට්ටුව හෝ පසක් ගිරි මූට්ටුව භාවිත කළ හැකි ය.

Q ස්ථානයේ දැව මූට්ටුව පිළිබඳ ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A පමණි. (2) C පමණි.
(3) A සහ B පමණි. (4) B සහ C පමණි.

* *

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

88 | S | I, II


අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

**නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය I, II**
வடிவமைப்பும் நிருமாணத் தொழினுட்பவியலும் I, II
Design and Construction Technology I, II

**නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය II**

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) වස්තුවක සමාංශක රූපයක් පහත ඉදිරිපත් කර ඇත.




(සියලු මිනුම් මිලිමීටරවලිනි.)

මෙම සමාංශක රූපය ආධාර කරගෙන

(1) ***A*** ඊතලය දෙසින් බලා ඉදිරි පෙනුම ද
(2) ***B*** ඊතලය දෙසින් බලා පැති පෙනුම ද
(3) ***C*** ඊතලය දෙසින් බලා සැලැස්ම ද

දී ඇති මිනුම් අනුව 1:1 පරිමාණයට තෙවන කෝණ සෘජු ප්‍රක්ෂේපණ ක්‍රමය අනුගමනය කරමින් අඳින්න.

(ii) අරය 40 mm ක් වූ වෘත්තයක් ඇඳ එහි පරිධිය සමාන කොටස් පහකට (05) බෙදන්න. (නිර්මාණ රේඛා පැහැදිලිව තිබීම අත්‍යවශ්‍ය වේ.)

PAST PAPERS WIKI

[අවවැනි පිටුව බලන්න.

**2.** ඉදිකිරීම් සඳහා බහුලව කොන්ක්‍රීට් භාවිත කරයි. කොන්ක්‍රීට් මිශ්‍රණයක් සකස් කරන ආකාරය මත ද කොන්ක්‍රීට්වල ගුණාත්මකභාවය තීරණය වේ.

(i) වැරගැන්වූ කොන්ක්‍රීට් තළාදයකට භාවිත කළ යුතු, තාක්ෂණිකව නිවැරදි කොන්ක්‍රීට් මිශ්‍රණය සඳහන් කරන්න.

(ii) කොන්ක්‍රීට් මිශ්‍රණයක අඩංගු වන ප්‍රධාන සංඝටක ද්‍රව්‍ය **හතර** නම් කරන්න.

(iii) කොන්ක්‍රීට් නිසි පරිදි පදම් නොකිරීම, කොන්ක්‍රීටයේ ශක්තිය අඩු වීමට හා දිරාපත් වීමට බලපාන ආකාරය වෙන් වෙන් වශයෙන් විස්තර කරන්න.

**3.** ඕනෑම ඉදිකිරීමකදී, ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ඇස්තමේන්තුවක් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ.

තානායමක ඉදිරිපස පිවිසුම් මාර්ගය දෙපස අලංකාරය පිණිස බඩගල් බැම් ක්‍රමයට දිග 5 m සහ උස 1.5 m වන පරිදි ගඩොල් බැම් දෙකක් ඉදිකිරීමට සැලසුම් කර ඇත.

පහත දත්ත පමණක් උපයෝගී කර ගනිමින් එම ගඩොල් බැම් දෙක ඉදිකිරීම සඳහා වියදම ගණනය කරන්න.

* ගඩොල් බැම්ම 1 $m^2$ක් බැඳීම සඳහා ගඩොල් 65ක් අවශ්‍ය වේ.
* ප්‍රවාහනයේදී හා භාවිතයේදී ගඩොල්වල නාස්තිය 5%කි.
* ගඩොල් 500ක මිල (පැටවීම, බෑම හා ප්‍රවාහන වියදම ද ඇතුළත්ව) රු. 3,500කි.
* බැම් ඉදිකිරීම සඳහා අවශ්‍ය 1:6 සිමෙන්ති:වැලි බදාමය, ද්‍රව්‍ය මිල සහ මිශ්‍ර කිරීමේ මිල ද ඇතුළත්ව රු. 20,000කි.
* බැම් දෙක ඉදිකිරීම සඳහා කම්කරු කුලිය රු. 15,000කි.


**4.** ගෘහස්ථ ජල සැපයුම් පද්ධති සඳහා බහුලව PVC නළ යොදාගනු ලබයි.

(i) PVC නළ සවි කිරීමට අවශ්‍ය ඇලවුම් ද්‍රව්‍ය සඳහන් කරන්න.

(ii) පහත දැක්වෙන PVC නළ උපාංගවල රූපසටහන් ඇඳ කෙරෙන කාර්යය **එක** බැගින් සඳහන් කරන්න.

* ඌනන කෙවෙනිය
* සමාන ටී සන්ධිය

(iii) පහත රූපසටහනේ දැක්වෙන්නේ ජල මීටරයේ සිට ජලය ගබඩා කිරීමේ ටැංකිය දක්වාත්, ටැංකියේ සිට ජල කරාමය දක්වාත් බෙදාහැරීමේ නළ පද්ධතියකි. රූපයේ දැක්වෙන A, B, C, D සහ E නම් කර එම එක් එක් කොටසේ කාර්යය කෙටියෙන් විස්තර කරන්න.




[නවවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



5. විවිධ ඉදිකිරීම් අමුද්‍රව්‍ය යොදාගනිමින් නූතන ලෝකයේ විශ්මිත නිර්මාණ ඉදිකරනු ලැබේ.

   (i) ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල දක්නට ලැබෙන ඉදිකිරීම් ක්ෂේත්‍රයට සම්බන්ධ විශ්මිත නිර්මාණ **දෙක** බැගින් නම් කරන්න.

   (ii) මෙවැනි විශ්මිත නිර්මාණ බිහිවීමට බලපා ඇති හේතු සාධක **දෙකක්** සඳහන් කර ඒ එකිනෙකක් ගැන කෙටියෙන් විස්තර කරන්න.

   (iii) නිර්මාණ ශිල්පීන් මෙවැනි විශ්මිත නිර්මාණ බිහි කිරීමේදී අනුගමනය කරන ක්‍රියාමාර්ගය කරුණු **හතරක්** ඔස්සේ විස්තර කරන්න.

6. දැව කර්මාන්තයේදී දැව මූට්ටු ඇලවීමට හා දැවවලට වෙනත් දේ ඇලවීමට මැලියම් වර්ග භාවිත වේ.

   (i) තෙත දේශගුණික තත්ත්වයන්ට හා මඳ වැසි සහිත දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන මැලියම් වර්ග **දෙකක්** නම් කරන්න.

   (ii) සත්ත්ව මැලියම් නිෂ්පාදනය කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

   (iii) රබර් මිශ්‍රිත මැලියම් වර්ග නිෂ්පාදනය කරන ආකාරය සහ භාවිත කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

7. දැවයෙන් සකස් කරන ලද පාසල් පුටුවක් පහත රූපයේ දැක්වේ.



   (i) මෙම පුටුව සකස් කිරීමට සහ නිමහම් කර නිම කිරීමට අවශ්‍ය උපකරණ/ආවුද වෙන වෙන ම සඳහන් කරන්න.

   (ii) මෙම පුටුව සකස් කිරීමට සුදුසු දැව වර්ගයක් නම් කර එම දැව වර්ගය තෝරා ගැනීමට හේතු කෙටියෙන් විස්තර කරන්න.


   (iii) ඉහත පුටුව සඳහා යෙදිය හැකි නිමහම් ආලේපයක් නම් කර එම ආලේපනය සිදු කරන ආකාරය පිළිවෙළින් විස්තර කරන්න.

* * *


# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට



Rs : 300




Rs : 300



Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300



Rs : 350



Rs : 300



Rs : 300



Rs : 200




Rs : 200




Rs : 200




Rs : 250




Rs : 250




Rs : 200




Rs : 200




Rs : 200


Rs : 300



Rs : 300



Rs : 200



Rs : 200



Rs : 250




Rs : 650


මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


## 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE